*සැ. යු.–* 2006.03.23 වැනි දින පළකරනලද 1490 දරන *ගැසට් පත්‍රයේ* VI(අ)කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,491 - 2007 මාර්තු 30 වැනි සිකුරාදා - 2007.03.30**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 256 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 261 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 256 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 262 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


(i) *සැ. යු.–* දෙශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2007 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරි පදනම (සංස්ථාගත කිරීම්) පනත් කෙටුම්පත 2007 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ජපන් ශාෂා අධ්‍යාපනය සඳහා වූ මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීම්) පනත් කෙටුම්පත 2007 පෙබරවාරි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මාර්තු මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පාවිච්චියෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම සඳහා වූ ටෙන්ඩරය - 2007

කොළඹ 12, උපරිමාධිකරණ සංකීර්ණයේ පිහිටි ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පාවිච්චියෙන් ඉවත් කළ පහත විස්තර කරන භාණ්ඩ විකිණීම සඳහා ටෙන්ඩර් 2007 අප්‍රේල් 25 දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

02. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර පූර්වෝක්ත 1 වන ඡේදයේ සඳහන් දින එකී වේලාවට ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ නිල කාමරයේදී විවෘත කරනු ඇත.

03. ටෙන්ඩර් නියමිත ආකෘතියේ ලියා ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 2007 අප්‍රේල් 09 වන දින සිට 2007 අප්‍රේල් 24 දින දක්වා ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ගිණුම් අංශය වෙතින් ලබාගත හැකිය.

04. සෑම ටෙන්ඩර් පතක්ම පිටපත් 02 කින් යුක්ත විය යුතු ය. ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පාවිච්චියෙන් ඉවත් කරන ලද භාණ්ඩ විකිණීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

05. විකිණීම සඳහා වූ භාණ්ඩ තොග වශයෙන් ඇති අතර, මිළදී ගැනීම සඳහා එකී භාණ්ඩ තොග වශයෙන් ම අයදුම් කළ යුතු ය. එක ටෙන්ඩර් පත්‍රයක අවශ්‍ය නම් තොග කිහිපයක් අයදුම් කළ හැකිය.

06. ලියාපදිංචි තැපැල් මගින් ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. නැතහොත් උපදෙස් පරිදි සකස් කළ ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ නියෝජිතයෙක් මගින් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් වෙත භාර දිය හැකිය.

07. ආපසු නොගෙවන රු. 300 ක ගාස්තුවක් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත ගෙවා ටෙන්ඩර් ආකෘති පත්‍රය සමග ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩරයට අමුණා එවිය යුතුය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු මහතාගෙන් විමසිය හැකිය.

බන්දුල කේ. අතපත්තු,
ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර්.
(ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති).

2007 මාර්තු 15 වන දින,
කොළඹ 12,
උපරිමාධිකරණ සංකීර්ණයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දීය.

වෙන්දේසි කිරීමට යෝජිත භාණ්ඩ

| | | | |
|---|---|---|---|
| 01. | දොර දෙකේ වානේ අල්මාරි | - | 18 |
| 02. | දොර හතරේ වානේ කබඩ් | - | 03 |
| 03. | වානේ මේස විධායක | - | 02 |
| 04. | වානේ මේස යතුරු ලියන | - | 01 |
| 05. | ලී අල්මාරි | - | 03 |
| 06. | ලී වීදුරු අල්මාරි | - | 01 |
| 07. | තට්ටු දෙකේ ෆයිල් රාක්ක | - | 02 |
| 08. | විදුලි පංකා (සිටුවන) | - | 03 |
| 09. | මේස විදුලි පංකා | - | 01 |
| 10. | ඉංග්‍රීසි යතුරු ලියන | - | 02 |
| 11. | යකඩ පුටු (කැරකෙන) | - | 03 |
| 12. | ලී ඇඳි සහිත පුටු | - | 07 |
| 13. | යකඩ ඇඳි සහිත පුටු | - | 01 |
| 14. | ලී යතුරුලියන පුටු | - | 11 |
| 15. | කල් ඉකුත් වූ රෝනියෝ කඩදාසි පැකට් | - | 266 |
| 16. | වාහන අමතර කොටස් තොගයක් | | |
| 17. | භාවිතයෙන් ඉවත් කළ ටයර් තොගයක් | | |
| 18. | පාවිච්චියෙන් ඉවත් කළ පරිඝණක උපාංග තොගයක්. | | |

03-805

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය – මිනුවන්ගොඩ

### අධිකරණයට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01 මිනුවන්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ, නඩුවලට අදාලව රාජසන්තක කරන ලද සහ මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2007.04.28 සෙනසුරාදා පෙ.ව. 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වෙයි නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි, එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතියි.

05. වෙන්දේසියේදී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා චෙක්පත්, මුදල් ඇණවුම් භාර නොගන්නා බැවින්, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු අතර, එදින පස්වරු 6.00 ට පෙර අදාල භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිළ දී ගන්නන් විසින්, තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

සී. වී සෙනෙවිරත්න,
මහෙස්ත්‍රාත් – මිනුවන්ගොඩ.

2007 මාර්තු මස 08 වන දින,
මිනුවන්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංක | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | බී. 274/01 | අංක 4564475 රාමුව ඇදළ වූ කළු පාට හීරෝ වර්ගයේ පාපැදිය |
| 02. | බී293/01 (78151) | හැමිල්ටන් එම්. අයි. බී. ස්ටිකරය යොදා ඇති කළු පාට පාපැදිය |
| 03. | එම | කොන්ස්ටාර් වර්ගයේ අංක නොමැති කොළ පාට පාපැදිය |
| 04. | බී 1504/02 (84765) | අංක එච්. ඒ. 91-01420 දරන පාපැදිය |
| 05. | බී 685/04 | අංක 820270 වර්ගය නොදන්නා පාපැදිය |
| 06. | බී 467/05 | එම්. ඕ. 90එච් ලෙස සඳහන් මවුන්ටන් පාපැදිය |
| 07. | ඒ.ආර්. 273/04 | අංක 5557253 දරන කළුපාට ලුමාලා පාපැදිය |
| 08. | ඒ.ආර්. 665/04 | අංක 55784885 දරන ලුමාලා පාපැදිය\ |
| 09. | ඒ.ආර්. 666/04 | අංක 06808644 දරන මවුන්ටන් පාපැදිය |
| 10. | ඒ.ආර්. 664/05 | අංක ජේ.ජේ. 063278 දරන ලුමාලා පාපැදිය |
| 11. | ඒ. ආර්. 759/04 | අංක පී 92002 වර්ගය නොදන්නා පාපැදිය |
| 12. | ඒ.ආර්. 776/04 | අංක 79ඒ 53236 ඒෂියන් වර්ගයේ පාපැදිය |
| 13. | ඒ.ආර්. 465/05 | පිලික්ස් රතු පාට මවුන්ටන් පාපැදිය |
| 14. | ඒ.ආර්. 466/05 | අංක සී. 314625 දරන හීරෝ රෝයල් පාපැදිය |
| 15. | බී 89/03 | වෙන්ස්මාර් වර්ගයේ කළු පාට පාපැදිය |
| 16. | ඒ.ආර්. 576/03 | අංක සී. සී. 10168 දරන පාපැදිය |
| 17. | බී 1015 | අංක රී. ඒ. 42439 දරන පාපැදිය |
| 18. | බී 833/03 | අංක 11ජී, 3747 නිල් පාට පර්සියන් පාපැදිය |
| 19. | 76825 | කළු පාට පාපැදිය |
| 20. | ඒ. ආර්. 151/05 | රතු, කොළ, නිල් මිශ්‍ර ළමා පාපැදිය |
| 21. | බී 6502 | මවුන්ටන් වර්ගයේ පාපැදිය |
| 22. | බී 780/02 | ලා නිල්පාට මළ බැඳුන පාපැදිය |
| 23. | 75929 | ඒ. ටී. බී. නිල්පාට ප්‍රේම් එක සහිත පාපැදිය |
| 24. | බී 70/99 | අංක 8657611 දරන හීරෝ වර්ගයේ පාපැදිය |
| 25. | 86870 | නිල් පාට රේසින් පාපැදිය |
| 26. | 84161 | අංක රී. වී. 294351 දරන කළු පාට පාපැදිය |
| 27. | බී. 544/04 | අංක ඕ.පී. 3089 රතු පාට පාපැදිය |
| 28. | බී 490/04 | රතු පාට ප්‍රේම් එක සහිත පාපැදිය |
| 29. | ඒ. ආර්. 756/04 | පාපැදිය |
| 30. | බී. 639/00 | රැලේ වර්ගයේ පාපැදිය |
| 31. | බී 672/03 | කළු පාට පාපැදිය |
| 32. | බී 502/04 (90203) | රැලේ වර්ගයේ පාපැදිය |
| 33. | බී 319/04 | අංක 121-3067 දරන යමහා වර්ගයේ යතුරු පැදිය |
| 34 | බී 1336/02 | චැසි අංක එම්. ඩී. 14 –1000320 සහ එන්ජින් අංක එම්. ඩී. සී. රී. 1007301 දරන රතු හා කළු පාට ට්‍රේල් වර්ගයේ යතුරු පැදිය. |
| 35. | බී 666/04 (90644) | අංක 107 ශ්‍රී 8114 දරන කොළ පාට වැලි වර්ගයේ යතුරු පැදිය |
| 36. | 53595 | අංක 123-0003 හොන්ඩා වර්ගයේ යතුරු පැදිය |
| 37. | බී. 669/04 | අංක 141-7904 යමහා 90 කළු පාට යතුරු පැදිය |
| 38. | 95854 | අංක 104-0155 යතුරු පැදිය |
| 39. | 90233 | චැසි අ ංක සී.බී. 125-ටී - 1019005 සහ එන්ජින් අංක සී. බී. 125 ටී රී. 1019007 හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය |
| 40. | 85533 | අංක රී.එන්.සී.බී. 125 ටී.රී. 28101 දරන යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි.) |
| 41. | 85232 | එන්ජින් අංක සී. බී. 125– ටී. රී. 1008924 දරන යතුරු පැදිය |
| 42. | 82562 | අංක 115–6897 සී. බී. 125 දරන යතුරු පැදිය |
| 43. | 86333 | එන්ජින් අංක එම්. ඩී. 90–1932488 සහ චැසි අංක එම්. ඩී. 90 – 1932404 දරන යතුරු පැදිය |
| 44. | 71482 | අංක 146–251 දරන මේට් වර්ගයේ යතුරු පැදිය |
| 45. | ඒ.ආර්. 74/05 | අංක සී.එෆ්. 702106261 සහ චැසි අංක සී. එෆ්. 70 රී 203081 දරන යතුරු පැදිය |
| 46. | ඒ. ආර්. 01/06 | අංක ඩබ්. ජී.පී. සී. 7354 යමහා ආර් 100 වර්ගයේ කළු පාට යතුරුපැදිය |
| 47. | ඒ. ආර්. 298/05 | අංක 92 ශ්‍රී 8920 එම්. බී. 08 හොණ්ඩා යතුරු පැදිය |
| 48. | ඒ. ආර්. 760/04 | අංක 107 – 3168 වැලි වර්ගයේ යතුරු පැදිය |
| 49. | ඒ.ආර්. 446/05 | අංක 134-8124 යතුරු පැදිය |
| 50. | බී 223/01 (78226) | පාපැදියක් |
| 51. | බී. 408/03 (85739) | අංක කේ. 161424 ඇයෝන් වර්ගයේ පාපැදිය |
| 52. | 83627 | අංක 115 – 8598 වැලි වර්ගයේ යතුරු පැදිය |
| 53. | 88151 | අංක 200 – 1185 දරන ත්‍රිවිල් රථය |
| 54. | 25732 | අංක 40 ශ්‍රී 8883 දරන එල්ෆ් වර්ගයේ දිරා ගිය ලොරි රථය ( අමතර කොටස් සඳහා පමණි) |
| 55. | බී102/03 (84980) | ශ්‍රී රාම් හොණ්ඩා සී. සී. 100 විදුලි ජනක යන්ත්‍රය |
| 56. | 94957 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 57. | 95207 | ඇලුමිනියම් මුට්ටි 02. |
| 58. | 96415 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 59. | 92648 | ප්ලාස්ටික් කළගෙඩි 02, බාල්දි 01. |
| 60. | 91745 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 61. | 94925 | ගෑස් සිලින්ඩරය හා ලිප |
| 62. | 95079 | ගෑස් සිලින්ඩරය |
| 63. | 93563 | බාල්දි 02යි |
| 64. | බී 1018/03 (90406/92273) | වතුර මෝටර් 01. (අංක රහිත සෙනලැක්ස් වර්ගයේ) |
| 65. | 92384 | තරාදි 01. |
| 66. | බී. 196/03 (89633) | තරාදි 01 |
| 67. | 97263 | කුළු ගෙඩි 02 |
| 68. | 60404 | කුළු ගෙඩි 01, අලවංගු 01. |
| 69. | 54815 | යකඩ ඉනි 01, කුළු ගෙඩි 01 යි |
| 70. | 54817 | යකඩ ඉනි 01 |
| 71. | ඒ. ආර්. 106/05 | පිරිමි අත්ඔරලෝසු 02, කාන්තා අත් ඔරලෝසු 02. |
| 72. | ඒ. ආර්. 587/04 | මේස ඔරලෝසු 01 |
| 73. | ඒ.ආර්. 667/04 | කාන්තා අත් බෑග් 06,<br>පිරිමි මුදල් පසුම්බි 05<br>කළු පාට ගමන් මලු 10<br>නිකෝන් වර්ගයේ කැමරාව<br>යෂිකා වර්ගයේ කැමරාව<br>විෂන් වර්ගයේ කැමරාව<br>සෝනි වෝක්මන් 01<br>අයිවා ස්ටීරියෝ වෝක්මන් 01<br>නිල් පාට බේසම<br>සබන් කැට කිහිපයක්<br>රවුම් හැඩයේ සුදු පාට මුහුණතක් ඇති බිත්ති ඔරලෝසුව<br>විෂන් වර්ගයේ වීදුරුව ගැලවී ඇති බිත්ති ඔරලෝසුව<br>කාන්තා, පිරිමි කලිසම් 12,<br>කමිස 05,<br>ටී. ෂර්ට් 01 |

| අනු අංක | නඩු අංක. | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 74. | ඒ.ආර්. 638/04 | එරික්සන් වර්ගයේ කළු පාට ජංගම දුරකථනය, නිල් පාට සහ කලු පාට මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථනය<br>කළු පාට එරික්සන් වර්ගයේ ජංගම දුරකථනය<br>නිල් පාට සහ කළු පාට සීමන්ස් වර්ගයේ ජංගම දුරකථනය |
| 75. | 80222 | කානු 04 ගෑස් ලිප් 01,<br>කහ පාට ලාෆ්ස් ගෑස් සිලින්ඩර් 01. |
| 76. | 60403 | යකඩ ඉනි 01 |
| 77. | 79105 | අන්නාසි කැති 01 |
| 78. | ඒ. ආර්. 668/04 | කැත්තක් |
| 79. | බී. 1581/02 | සවලක් |
| 80. | අංක රහිත | සවල් 25 |
| 81. | 86522 | ඇලුමිනියම් කැබලි සහ වොට් 500 ප්ලෑෂ් ලයිට් 01 |
| 82. | බී 135/05 (55357) | කුළු ගෙඩි 04, යකඩ ඉනි 02යි |
| 83. | බී.134/05 (55359) | කුළු ගෙඩි 09<br>ගල් විදින බෝර කටු 07<br>යකඩ ඉනි 06 |
| 84. | 60403 | අලවංගු 01 |
| 85. | බී 450/04 | යමාටා වර්ගයේ අධිවේගී මහන මැෂින් 04<br>ජුකී වර්ගයේ අධිවේගී මහන මැෂින් 01. |

03 – 741

---

### මහෙස්ත්‍රාත් අධිකරණය - කුරුණෑගල

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ හා කාර්යාලයෙන් ඉවත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිනීම

කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හා ඉතා පැරණි, නඩු අංක රහිත, මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කාර්යාලයෙන් ඉවත් කරනු ලැබූ පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2007.04.09 වැනි දින පෙ. ව. 9.00ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු හෝ කියන්නන් වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දිනට පෙර හෝ 'එකී වෙලාවට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුවේ.

03. වෙන්දේසියෙන් මිළදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම මුදල් ගෙවිය යුතු අතර සියළුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුයි. චෙක්පත් හෝ මුදල් ඇනවුම් බාරගනු නොලැබේ.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය අනුව, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගන්නා අය තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු අතර මිළදී, ගන්නා භාණ්ඩ සියල්ල අධිකරණ භූමියෙන් ප.ව. 4.00ට පෙර ඉවත් කර ගත යුතුය.

මහෙස්ත්‍රාත් - කුරුණෑගල.

2007 පෙබරවාරි මස 27 වැනි දින,
කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### රාජසන්තක කරන ලද හා කාර්යාලයෙන් ඉවත් කරන ලද භාණ්ඩ වෙන්දේසිය - 2007/1 කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණය

| | | |
|---|---|---|
| 01. | 59200 | ලි.ප. අංක 153-6675, චැසි අංක CB125T - 1022418 සහ එන්ජින් අංක CB125TE-1022425 දරන හොන්ඩා CB125 යතුරු පැදිය |
| 02. | 56903 | ලි.ප. අංක 136-3533 චැසි අංක F5B-831776 සහ එන්ජින් අංක F5B-831776-L/S දරන යමහා යතුරු පැදිය |
| 03. | 8733 | ලි.ප. අංක 106ශ්‍රී 5364, චැසි අංක F5B-715213 සහ එන්ජින් අංක F5B-715213 දරන යමහා යතුරු පැදිය |
| 04. | 38534 | ව්‍යාජ චැසි අංක AC01-110472 සහ එන්ජින් අංක AC01E-104669 දරන අබලන් හොන්ඩා යතුරු පැදිය |
| 05. | AR/2179 | චැසි අංක V50-6981630 සහ එන්ජින් අංක V50-6981630 සහ දරණ යමහා මේට් 50 යතුරු පැදිය |
| 06. | AR/480 | ලි.ප. අංක 105-1851, ව්‍යාජ චැසි අංක V50-502593 සහ ව්‍යාජ එන්ජින් V50---- අංක දරන යමහා මේට් යතුරු පැදිය |
| 07. | AR/1214 | ලි.ප. අංක 92 ශ්‍රී 2718, චැසි අංක AD01-1014995 සහ එන්ජින් අංක AD01E-1015071 දරන හොන්ඩා යතුරු පැදිය |
| 08. | AR/61 | ලි.ප. අංක 144-2968, චැසි අංක K90-325221 සහ එන්ජින් අංක K90-328273 දරන සුසුකි යතුරු පැදිය |
| 09. | අංක රහිත | ලි.ප. අංක 153-6675, චැසි අංක AC01-1026885 සහ එන්ජින් අංක AC-01E-1023629 දරන හොන්ඩා යතුරු පැදිය |
| 10. | අංක රහිත | චැසි අංක 2U2-048881 සහ එන්ජින් අංක 481 දරන යමහා යතුරු පැදිය |
| 11. | අංක රහිත | ලි.ප. අංක 126-9511, චැසි අංක AC01-1110243 සහ එන්ජින් අංක AC01E-1110237 දරන හොන්ඩා යතුරු පැදිය |
| 12. | අංක රහිත | ලි.ප. අංක 124-6775, චැසි අංක AC01-1102545 සහ එන්ජින් අංක AC01E-1016530 දරන හොන්ඩා යතුරු පැදිය |
| 13. | අංක රහිත | ලි.ප. අංක 100-3794, චැසි අංක 4B6-281662 සහ එන්ජින් අංක 4B6-239681 දරන යමහා යතුරු පැදිය |
| 14. | අංක රහිත | ලි. ප. අංක 122-7365, චැසි අංක AC01-1062093 සහ එන්ජින් අංක AC01E-1028732 දරන හොන්ඩා යතුරු පැදිය |
| 15. | අංක රහිත | චැසි අංක F5B-711081 සහ එන්ජින් අංක F5B-711081 දරන යමහා යතුරු පැදිය |
| 16. | අංක රහිත | ලි. ප. අංක 80 ශ්‍රී 3448, චැසි අංක 3X2-000474 සහ එන්ජින් අංක 3X2-000474 දරන යමහා යතුරු පැදිය |

| | | |
|---|---|---|
| 17. | අංක රහිත | වැසි අංක F5B-708470 සහ එන්ජින් අංක F5B දරන යමහා යතුරු පැදිය |
| 18. | අංක රහිත | වැසි අංක FR50-873292 දරන සුසුකි යතුරු පැදිය |
| 19. | B/2344/03 | ලි.ප. අංක 108-5788, එන්ජින් අංක V80-1102370 සහ වැසි අංක V80-102370 දරන යමහා 80 යතුරු පැදිය |
| 20. | අංක රහිත | ලි. ප. අංක 143-3893, වැසි අංක V90T-301582 සහ එන්ජින් අංක V90T-301582 දරන යමහා මේට් 90 යතුරු පැදිය |
| 21. | 63119 | ලි.ප. අංක 141-8420 වැසි අංක ADO1-1009322 සහ එන්ජින් අංක ADO1E-1009055 දරන හොන්ඩා යතුරු පැදිය |
| 22. | 39461 | යතුරු පැදි පැති ආවරණ 04ක් |
| 23. | අංක රහිත | වර්ගය අපැහැදිලි පාපැදියක් |
| 24. | අංක රහිත | වර්ග අපැහැදිලි පාපැදියක් |
| 25. | AR/1489 | ඒෂියා බයික් වර්ගයේ පාපැදියක් |
| 26. | AR/8951 | වර්ගය අපැහැදිලි පාපැදියක් |
| 27. | AR/234 | නැෂනල් වර්ගයේ කැසට් රේඩියෝව සහිත රූපවාහිනිය |
| 28. | AR/412 | ටෙලිසොනික් වර්ගයේ කැසට් රේඩියෝව |
| 29. | AR/569 | සොනාෂි වර්ගයේ කැසට් රේඩියෝව |
| 30. | AR/841 | බෆල් එකක් |
| 31. | AR/412 | Brundi වර්ගයේ අඟල් 14ක් වර්ණ රූපවාහිනිය, එහි දුරස්ථ පාලකය, බූස්ටරය, ඇන්ටනා දුරස්ථ පාලකය |
| 32. | AR/412 | මොඩල් අංක SLF -178B දරන රේඩියෝව සහිත විදුලි ලාම්පුව |
| 33. | AR/566 | වර්ග අපැහැදිලි වාහන කැසට් යන්ත්‍ර වලින් 02ක් |
| 34. | අංක රහිත | නැෂනල් පැනසොනික් වර්ගයේ ස්පීකර දෙකේ කැසට් රේඩියෝව |
| 35. | අංක රහිත | නැෂනල් වර්ගයේ ස්පීකර දෙකේ කැසට් රේඩියෝව |
| 36. | B/1326/93 | නැෂනල් වර්ගයේ ස්පීකර දෙකේ කැසට් රේඩියෝව |
| 37. | අංක රහිත | යුනික් වර්ගයේ කුඩා රේඩියෝව |
| 38. | අංක රහිත | උෂා වර්ගයේ මහන මැෂිම |
| 39. | 53652/06 | කියත්තලය සහිත දැව ඉරුම්පට්ටලයක් |
| 40. | 68755 | කියත්තලයක් |
| 41. | B/40065 | ප්‍රධාන ස්විච් 01ක් සහ ට්‍රිප් ස්විච් 04ක් |
| 42. | අංක රහිත | උදළුතල 06ක් |
| 43. | අංක රහිත | ඇළුමිනියම් මුට්ටි 06ක් |
| 44. | අංක රහිත | ඇළුමිනියම් කල 02ක් |
| 45. | අංක රහිත | සවල් තොගයක් |
| 46. | 62349 | බිම් තරාදියක් |
| 47. | 69360 | 100 කි. ග්‍රෑ. ක දුනු තරාදියක් |
| 48. | 71976 | 100 කි. ග්‍රෑ. ක දුනු තරාදියක් |
| 49. | 69361 | 10 කි. ග්‍රෑ. ක දුනු තරාදියක් |
| 50. | 69362 | තැටි තරාදියක් |
| 51. | අංක රහිත | තැටි තරාදි තොගයක් |
| 52. | අංක රහිත | චේන්බ්ලොක් 02ක් |
| 53. | 53652/06 | ඉන්ජින් අංක 17748 දරන සහ ව්‍යාජ වැසි අංක සහිත අබලන් අත්ට්‍රැක්ටරයක් |
| 54. | අංක රහිත | බෝතල් තොගයක් |

*කාර්යාලයෙන් ඉවත් කරන ලද භාණ්ඩ (අබලන්)*

55. පුටු ඇඳි සහිත 26ක්
56. පුටු ඇඳි රහිත 02ක්
57. පුටු (වානේ අත්සහිත කුෂන්) 04ක්
58. පුටු 13ක පමණ කැබලි තොගයක්
59. පුටු විසිත්ත කාමර 01 ක්
60. බංකු ඇඳි සහිත 02ක්
61. මේස ලිපිකරු 03ක්
62. මේස යතුරු ලියන 01ක්
63. මේස සාමාන්‍ය 07ක්
64. මේස පොඩි 01ක්
65. ලොකු ලාච්චු 11ක්
66. පොඩි ලාච්චු 04ක්
67. ලාච්චු කුඩු 01ක්
68. සාක්ෂි කුඩු 01ක්
69. පොත් රාක්ක 02ක්
70. ලී පෙට්ටි 02ක්
71. වානේ කබඩ් (ලාච්චු 04ක්) 04ක්
72. යතුරු ලියන 01ක්
73. පිල්ටර කැබලි 01ක්

03-745

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### අබලි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නිකවැරටිය කොට්ඨාශයේ, මහව, නිකවැරටිය පොලිස් දිසා ගබඩාවන්හි ඇති පහත දැක්වෙන අබලි භාණ්ඩ 2007.04.20 වැනි දින පැය 0900 සිට පැය 1200 දක්වා කාලය තුළදී නිකවැරටිය මූලස්ථාන පොලිස් භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. අදාල භාණ්ඩ ගැණුම්කරුවන්ට එදින පෙ. ව. 0700 සිට පෙ. ව. 0900 දක්වා කාලය තුළදී එම ස්ථානයේ දී පරීක්ෂා කර බැලිය හැක.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ඉල්ලුම් කරනු ලබන වැඩිම ඉල්ලුමට තීරණය වූ වහාම මුදලින් අදාළ ගෙවීම් කර භාණ්ඩය එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය.

වෙන්දේසියෙන් පසු ඉවත් කරනු නොලබන භාණ්ඩ පිළිබඳ වග කියනු නොලැබේ. මෙහි පහත දැක්වෙන භාණ්ඩ අතුරින් කිසිවක් වෙන්දේසියට ඉදිරිපත් නොකිරීම හෝ ඉවත් කිරීමේ බලය වෙන්දේසි මණ්ඩලය සතුය.

කිත්සිරි දයානන්ද,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
නිකවැරටිය කොට්ඨාශය.

2007 මාර්තු මස 14 වැනි දින,
පොලිස් කාර්යාලය,
නිකවැරටිය.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ විස්තරය

| | | |
|---|---|---|
| 01. | යකඩ ඇඳන් (ඩබල්) | 21 |
| 02. | යකඩ ඇඳන් (සිංගල්) | 01 |
| 03. | රේඩියෝ කැසට් | 02 |
| 04. | පා පැදි | 15 |
| 05. | රූපවාහිනි යන්ත්‍ර | 02 |
| 06. | යතුරු ලියන (සිංහල) | 06 |

| | | |
|---|---|---|
| 07. | කල්දේරම් 24" | 04 |
| 08. | කල්දේරම් 18" | 01 |
| 09. | කල්දේරම් 16" | 04 |
| 10. | කල්දේරම් 12" | 01 |
| 11. | ගෑස් සිලින්ඩර් | 01 |
| 12. | පැක්ස් යන්ත්‍ර | 01 |
| 13. | ලන්තෑරුම් | 03 |
| 14. | උදලු තල | 14 |
| 15. | ඉබි යතුරු (කැඩුනු) | 44 |
| 16. | වතුර ෆිල්ටර් | 13 |
| 17. | විදුලි කේතල් | 11 |
| 18. | කල්දේරම් | 06 |
| 19. | මේස විදුලිපංකා | 13 |
| 20. | බාල්දි | 01 |
| 21. | කේතල | 03 |
| 22. | අහල් 4 ටියුබ් ලයිට් සෙට් | 03 |
| 23. | අහල් 2 ටියුබ් ලයිට් සෙට් | 02 |
| 24. | යකඩ පුටු | 06 |
| 25. | බිත්ති ඔරලෝසු | 03 |
| 26. | යකඩ ඉනි | 03 |
| 27. | ආරක්ෂක විදුලි ලාම්පු | 04 |
| 28. | වතුර බොයිලේරු | 01 |
| 29. | සාස්පාන් කුඩා | 03 |
| 30. | ඇලුමිනියම් බේසන් | 01 |
| 31. | සිවිලින් විදුලිපංකා | 08 |
| 32. | මන්නා පිහි | 01 |
| 33. | හිරමනා | 02 |
| 34. | පොරව තල | 03 |
| 35. | පීඩන ලාම්පු | 01 |
| 36. | ෆයිබර් පුටු | 03 |
| 37. | සපත්තු ජෝඩු | 03 |
| 38. | ඇලුමිනියම් පිහන් | 01 |
| 39. | බන්දේසි | 01 |
| 40. | මල්ටිපොට් | 01 |
| 41. | අත් මුල්ලු | 01 |
| 42. | කැති කුඩා | 01 |
| 43. | ඇලුමිනියම් තේ පෝච්චි | 01 |
| 44. | කැරම් බෝඩ් | 01 |
| 45. | එනමල් ජෝගු | 01 |
| 46. | ඩයිනමෝ ලාම්පු | 01 |
| 47. | යකඩ පුටු | 02 |
| 48. | ඇලුමිනියම් කලගෙඩි | 02 |
| 49. | ගිනි නිවීමේ උපකරණ | 01 |
| 50. | විසිකැති | 03 |
| 51. | ලොකු ලී පුටු | 06 |
| 52. | කුඩා ලී පුටු | 07 |
| 53. | විදුලි කැල්කියුලේටර් | 01 |
| 54. | කැල්කියුලේටර් | 01 |

03–791

## මහාධිකරණය - අම්පාර

### භාණ්ඩ වෙන්දේසිය

අම්පාර මහාධිකරණයේ අවසන් වූ නඩු වලට අදාල රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩයන් 2007 මැයි මස 19 වන දින පෙ. ව. 10.00ට අම්පාර මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් හිමිකම් නොවන භාණ්ඩයන් සම්බන්ධයෙන් හිමිකම් කියන අයකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ.ව. 9.15 සිට පෙ. ව. 9.45 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථා වලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවලේම මුදල් ගෙවිය යුතු අතර චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩයන් එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතුය.

පී. පී. සූරසේන,
මහාධිකරණ විනිසුරු - අම්පාර.

2007 පෙබරවාරි මස 26 වැනි දින,
අම්පාර මහාධිකරණයේ දී ය.

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අම්/මහාධි/815/03 | 142-5574 අංක දරණ හොණ්ඩා වර්ගයේ යතුරු පැදි | 01 |
| 02. | අම්/මහාධි/822/04 | අංක 55778290 දරණ පාපැදි | 01 |
| 03. | අම්/මහාධි/865/04 | අංක ඒ 51581 දරන පාපැදි | 01 |
| 04. | අම්/මහාධි/966/05 | අංක ඉ. ආර්. 7081 දරන පාපැදි | 01 |
| 05. | අම්/මහාධි/853/04 | අංක 01ඒ 6656 දරන පාපැදි | 01 |
| 06. | අම්/මහාධි/828/04 | අංක ඒ 1259/142 දරන පාපැදි | 01 |
| 07. | අම්/මහාධි/828/04 | අංක 11151185 දරන පාපැදි | 01 |
| 08. | අම්/මහාධි/968/05 | අංක 041106579 දරන පාපැදි | 01 |
| 09. | අම්/මහාධි/925/04 | අංක ඒ 149435 දරන පාපැදි | 01 |
| 10. | අම්/මහාධි/1005/05 | අංක අපැහැදිලි සුපර් යැයි සඳහන් කර ඇති පා පැදි | 01 |

| | | | |
|---|---|---|---|
| 11. | අම්/මහාධි/178/97 | අංක අපැහැදිලි පාපැදි | 01 |
| 12. | අම්/මහාධි/975/05 | උදලු | 01 |
| 13. | අම්/මහාධි/360/2000 | උදලු | 01 |
| 14. | අම්/මහාධි/991/05 | පොරව | 01 |
| 15. | අම්/මහාධි/786/02 | කැති | 01 |
| 16. | අම්/මහාධි/833/03 | පිහියා | 01 |
| 17. | අම්/මහාධි/793/02 | පිහියා | 01 |
| 18. | අම්/මහාධි/731/02 | පිහියා | 01 |
| 19. | අම්/මහාධි/712/02 | පිහියා | 01 |
| 20. | අම්/මහාධි/876/03 | පිහියා | 01 |
| 21. | අම්/මහාධි/1057/06 | පිහියා | 01 |
| 22. | අම්/මහාධි/1047/05 | පිහියා | 01 |
| 23. | අම්/මහාධි/947/05 | පිහියා | 01 |
| 24. | අම්/මහාධි/639/02 | පිහියා | 01 |

මහාධිකරණ විනිසුරු - අම්පාර.

2007 පෙබරවාරි මස 21 වැනි දින,

අම්පාර මහාධිකරණයේ දී ය.

03-747

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙර කරනු ලබන දැන්වීම

අංගොඩ, කුඩාබුත්ගමුව පාර, අංක 235/1බී දරන තැන පදිංචි පොත්තම්පෙරුම ආරච්චිගේ දෝන ප්‍රියංකා නිලාන්ති වන මම නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නොතාරිස් ආඥා පනතේ විධිවිධාන වලට අනුව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටීමට අදහස් කරන බව මෙයින් දන්වමි.

පී. ඒ. ඩී. පී. නිලාන්ති.

2007 මාර්තු මස 10 වැනි දින,
235/1බී, කුඩාබුත්ගමුව පාර,
අංගොඩ.

03-772

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 12/2, කන්දෙගොඩ, අම්බලන්ගොඩ පදිංචි රුවන් චාමින්ද රණසිංහ (ජා. හැ. අංක 710661120V දරන) වන මම කුලීගොඩ මහරුප්ප පදිංචි සුනිත් ද සිල්වා වන අයට අම්බලන්ගොඩ පදිංචි ඩී. ඩී. ද එස්. සේනාපති ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියන ලද අංක 320 හා 2002 නොවැම්බර් මස 04 වැනි දින දාතම දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරමි.

රුවන් චාමින්ද රණසිංහ.

03-795

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පන්නිපිටිය, බ්‍රාහ්මණගම, පොදු ජන මාවත, අංක 79/1 හි පදිංචි වෙල්හේනගේ සුමිත්‍රා කුමුදිනි ද සිල්වා වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එස්. දිසානායක විසින් සහතික කරන ලද වර්ෂ 2003ක් වූ ඔක්තෝබර් මස 04 වන දිනැති අංක 2550 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පන්නිපිටිය, මොරකැටිය, රුක්මලේ පාර, අංක 595/1හි පදිංචි වෙල්හේනගේ සෞම්‍යා ප්‍රියානි ද සිල්වා වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2007 ක් වූ මාර්තු මස 16 වන දා සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බවට ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ.

වෙල්ලහේනගේ සුමිත්‍රා කුමුදිනි ද සිල්වා,

03–845

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

බදුල්ල, ස්ප්‍රින්වැලි, කෝට්ටෙගොඩ රංජිත් ස්ටෝර්ස් හි පදිංචිව සිට දැනට අංක 734/27/ඒ, දවටගහවත්ත වත්ත යන ලිපිනයේ පදිංචි පෝරගේ පොඩිහාමිනේ වන මා විසින් 2005.10.21 දින පානදුර, ආර්. ඒ. ගාමිණී සී. පෙරේරා නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මහතා ඉදිරියේ අත්සන් කර බදුරලියේ හැඩිගල්ල ජනපදයේ සමගිපුර පදිංචි හපුහෙට්ටිගේ දොන් ආරියවංස යන අයට මා වෙනුවෙන් මාගේ සියලු වැඩ කටයුතු කිරීම පිණිස පවරන ලද අංක 142 දරන ඇටෝර්නි බලය 2007.01.01 දින සිට මා විසින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට ඔහු විසින් කරන ලද හෝ අත්සන් කරන ලද කිසිම ලියවිල්ලකට මා වග නොකියන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයටත්, ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

පී. පොඩිහාමිනේ.

03-790

## ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

2006 අගෝස්තු 18 දින සහ අංක 146 දරන කලුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. හයිදර් හසන් මහතා විසින් ලියා සහතික කරන ලද අලුත්ගම, කලුවාමෝදර ගම්මැද්ද, ගම්මැද්ද පාරේ, අංක 221හි පදිංචි ශ්‍රියාන් චන්දිමාල් ද සිල්වා යොම්මෙරෙන්නගේ විසින් ජර්මනියේ 40789 මොන්හෙයිම්/රෙයින් 20, රොබර්ට් කොම් වීදියේ පදිංචි අල්මුට් ගර්ට්රුඩ් මාගරට් හිම්මල්ස්බච් මහත්මිය වෙත පවරන ලද ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරන අතර ඉහත කී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට පහත අත්සන් කරන අය වගකියනු නොලැබේ.

ශ්‍රියාන් චන්දිමාල් ද සිල්වා,
යොම්මෙරෙන්නගේ.

03-829

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කල නිල සුනඛයින් 08 දෙනෙක් 2007.04.03 වැනි දින පැය 09.00ට අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම නිල සුනඛයින් 2007.04.02 වැනි දින පැය 09.00 සිට පැය 15.00 දක්වා පරීක්ෂා කර බලා ගැනීමට හැකි බව දන්වා සිටිමි.

මූලස්ථාන පොලිස් පරීක්ෂක,
පොලිස් නිලසුනඛයින් පුහුණුකිරීමේ මූලස්ථානය,
අස්ගිරිය, මහනුවර

| *වර්ගය* | *ගැහැනු/පිරිමි* | *එකතුව* |
|---|---|---|
| ලැබ්බුඩෝ රිට්රිව | ගැහැනු | 01 |
| ජර්මන් ෂෙපර්ඩ් | පිරිමි | 02 |
| ජර්මන් ෂෙපර්ඩ් | ගැහැනු | 03 |
| රෝට්වයලර් | පිරිමි | 01 |
| දෙමුහුන් (ඩොබමන් හා ජර්මන් ෂෙපර්ඩ්) | පිරිමි | 01 |
| | | 08 |

03-769

---

## සෙලින්කෝ සංවර්ධන බැංකුව

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

ඇරැවල, පන්නිපිටිය වසන කන්දනගේ දොන් අමරදාසට අයත් අංක 281/2ඒ හා 281/2 ලෙස ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම අ. 0, රූ. 3, පර්. 22

රුපියල් නවලක්ෂ හතලිස් හය දහස් එකසිය හතලිස් අටක් (රු. 9,46,148)මුදලක්ද, 2003.01.06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 24% බැගින් පොළිය සමග මුළු මුදල විත්තිකරු විසින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බව ද, එකී තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මුල් මුදල හා පොළිය සහිත වූ මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වනතුරු නෛතික පොළිය ද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කරන ලද බැවින් උසාවි වියදම් හා වෙන්දේසිකරුගේ ගාස්තුව අයකර ගැනීම පිණිස අංක 289, ඇරැව්වල, පන්නිපිටියේ වසන කන්දනගේ දොන් අමරදාසට විරුද්ධව සීමාසහිත සෙලින්කෝ වෙන්චර් කැපිටල් සමාගම, අංක 277, යූනියන් පෙදෙස, කොළඹ 2 විසින් කොළඹ බස්නාහිර පළාතේ දිසා අධිකරණයේ පවරන ලද අංක 16993/ එම්. බී. දරන නඩුවෙන් මා වෙත නිකුත් කරන ලද නියෝගය. පහත සඳහන් දේපළ 2007.04.26 දින 11.00 කනිසමට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, පන්නිපිටිය-පිළියන්දල මහ පාරට යාව ඇරැව්වල පිහිටි අලුබෝගහවත්ත නැමති ඉඩමට බලයලත් මානක මර්වින් සමරනායක විසින් 1980 දෙසැම්බර් මස 10 වැනි දින සාදන ලද අංක 120 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1, 2, 3 දරන ඒකාබද්ධ බිම් කොටස්වලට මායිම්, උතුරට : පිළියන්දල/පන්නිපිටිය මහ පාර ද, නැගෙනහිරට : එම්. ඊ. චන්ද්‍රපාලට අයත් අලුබොගහවත්ත ; දකුණට : කුඹුර සහ බස්නාහිරට : අලුබොගහවත්ත සහ කේ. දොන් ඩැනියෙල්ට අයිති දෙවටගහවත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් තුන, පර්චස් විසිදෙක (අ.0, රූ. 3, පර්. 22) ක් විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දැනට ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1547/165 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසිය හැකි මාර්ගය.*- පන්නිපිටිය මොරකැටි හංදියේ සිට ඇරැව්වල පාරේ කිලෝ මීටර් 2 ක් පමණ ගිය විට පන්නිපිටියේ පිළියන්දල මහා පාරට යාව අංක 281/2ඒ දරන ඉඩම.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට මුදලින් ගෙවිය යුතුය.

(1) 25% ක් ගැණුම් මුදලින් ද,
(2) 01% පළාත් පාලන ආයතන ගාස්තු සහ වැට් බද්ද ද,
(3) 2 1/2% විකුණුම් මුදලින් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තු රු. 2,000 ක් ද.

වෙන්දේසි දිනයේ වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල ඉහත සඳහන් නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර සඳහා දමිත් තෙන්නකෝන් මහතා, සෙලින්කෝ සංවර්ධන බැංකුව, 5 වන මහළ, සෙලින්කෝ නිවස, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.

දුරකතන අංක 2388388, 0777222457.

| | |
|---|---|
| ආර්. එස්. එම්. ඔක්ෂන්ස්, | රංජිත එස්. මහානාම |
| මහානාම ඩ්‍රයිව්, | සාම විනිසුරු (මුළු දිවයිනටම) |
| අංක 474, පිටකෝට්ටේ, | උසාවි කොමසාරිස්, තක්සේරුකරු, |
| කෝට්ටේ. | හා බලයලත් වෙන්දේසිකරු. |

දුරකථන අංකය : 2863121.

03-807

---

## මහජන බැංකුව – ඕල්කොට් මාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සිය නෑ කෝරළේ අධිකාරි පත්තුවේ මාකොළ උතුර පිහිටි මීගහවත්ත හා කැටකැලගහවත්ත, හා හපුගහවත්ත, ඇටඹගහවත්ත හා පබුලුමුල්ලවත්ත බ/මි එම්. ඩී. කේ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 1367 දරන 1981.07.04 දින සහ 2000.10.19 සත්‍ය පිටපත් ලෙස නිකුත් කරන ලද මානක පිඹුරේ, අංක 07 ලෙස ලකුණු කර ඇති පර්චස්

විස්සකින් යුත් බෙදා වෙන්කළ (ප.20) විශාල බිම්කොටස ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සී 573/28 සහ පර්චස් 03යි දශම දෙකයි පහකින් යුක්තවූ හා ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 554/75 යටතේ, ලියාපදිංචිව ඇති එකී අංක 5430 ඒ දරන පිඹුරේ විස්තර කර ඇති හයවන බිම් කට්ටිය මත හා ඒ දිගේ මාර්ග අයිතිය සහිත එහි පිහිටි සියලු දේ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007 අප්‍රේල් මස 21 වෙනි දින පෙ. ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2006.11.16 දින පුවත් පත් මගින් ද, 2006.12.01 දින *ගැසට් පත්‍රයේ* පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම:* කිරිබත්ගොඩ මාකොළ පාරේ ටික දුරක් ගියවිට දේවාල පාර හමුවේ. එම පාරේ කි. මීටර් 3 ක් පමණ ගිය විට පාරෙන් වමට අදාල දේපල අංක 130/2 ඒ දේවාල පාර, මාකොළ උතුර මාකොළ යනුවෙන් ලිපිනය දැක්වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසියේ අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 01% ;
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ;
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ;
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
6. විකුණුම් සහතිකය සඳහා වෙනත් ගාස්තු.

ගැනුම් මිලෙන් 90% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කොළඹ 01, ආදිපාද වීදියේ, අංක 11 හි පිහිටි මහජන බැංකු බටහිර කළාප කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි, බටහිර කළාප 01ට ගෙවිය යුතුය.

දු. ක. අංකः 2387068/ෆැක්ස් 2435977 හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාම විනිසුරු වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා භාෂා පරිවර්තක.

අංකः 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දු. ක. : 2810145/0777-212602.

03-830

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීමයි

ණය අංක : 1/28244/සීබී9/796.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.02.17 වන දින *ගැසට්* පත්‍රයේ සහ 2006.04.10 වැනිදා දිනමිණ පත්‍රයේ පළකරනු ලැබුවාවූද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගතයුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේදී 2007.05.05 වෙනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව නගර සභා සීමාවේ, එගොඩඋයන පිහිටි එකිනෙකට යාව පිහිටි බිම් කොටස් දැන් එක් දේපලක් ලෙස හැඳින්වෙන මාදන්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සකසන ලද 1995.08.18 දිනැති හා අංක 4711 දරන පිඹුරේ දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්.7 ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 331/147 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරි.

2007 මාර්තු මස 16 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03,
.
03-841/2

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදන

කේ. ඩී. වික්‍රමපාල - ගිණුම් අංක : 1046 5001 6300.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.20 වන දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2007.03.23 වන දින රජයේ *ගැසට්* පත්‍රයේ ද, 2005.07.22 දිවයින අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දොළොස් ලක්ෂ පහළොස්දහසක (රු. 1,215,000 ) මුදල සහ තවත් රුපියල් එකොලොස් ලක්ෂ හැට අටදහසක (රු. 1,168,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහඅට (18%) බැගින් 2004 ජූනි මස 26 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2007.04.19 දින ප. ව. 1.00ට පිහිටි ස්ථානයේ දී

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර කෝරලේ, පස්සර කොට්ඨාශයේ, තොලබෝවත්තේ, පල්ලෙගම පිහිටි ගොරොක්ගහලන්ද වත්ත (කොටසක්) නමැති උතුරට : එම්. ඒ. දොන් සුගතදාස අයිතිය කියන ඉඩමේ මායිම් ද; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස වෙන් කෙරෙන වැට ද ; දකුණට: එම ඉඩමේ ම ඉතිරි කොටස වෙන් කෙරෙන වැට ද, සහ බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටස වෙන් කෙරෙන වැටද මායිම් වන බදුල්ල ඉඩම් කාර්යාලයේ පී 50/274 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් අක්කර පහක් (අ. 5 රූඩ්. 0, පර්. 0) වන සම්පූර්ණ ඉඩම එහි පිහිටි හා එයට අදාල ගොඩනැගිලි, වගාවන් හා අනෙකුත් සියළුම දේ සමග ය.

බණ්ඩාරවෙල බලයලත් මිනින්දෝරු ගාමිණී සමරක්කොඩි විසින් එකී ඉඩම මැන සාදන ලද 1990 අගෝස්තු මස 2 දාතම හා අංක 1029 දරන මිනුම් පිඹුරේ දැන් ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට: ගොරොක්ගහලන්ද වත්තේ ඉතිරි කොටස වෙන් කෙරෙන කම්බි වැට ද ; නැගෙනහිරට : ගොරොක්ගහලන්ද වත්තේ ඉතිරි කොටස ද, දකුණට: ගොරොක්ගහලන්ද වත්තේ ඉතිරි කොටස ද සහ බටහිරට : ගොරොක්ගහලන්ද වත්තේ ඉතිරි කොටස ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර පහක් (අක්. 5, රූඩ් 0, පර්. 0) හෝ හෙක්ටයාර් 2.024 ක් වන ඉඩම එහි පිහිටි හා එයට අදාල ගොඩනැගිලි වගාවන් හා අනෙකුත් සියලු දේ සමගය.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ජී. සමරක්කොඩි විසින් සාදන ලද 1990 අගෝස්තු 2 දාතම හා අංක 2536 දරන (එම මිනින්දෝරු තැන විසින්ම සාදන ලද 1990 අගෝස්තු 2 දාතම හා අංක 1029 දරන පිඹුරේ උපුටනයක් වන) මිනුම් පිඹුරට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කොට ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර කෝරලේ, පස්සර කොට්ඨාසයේ තොලබෝවත්ත පල්ලේගම ග්‍රාමයේ පිහිටි ගොරොක්ගහලන්ද වත්ත නැමැති ඉඩමෙන් බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ඉහත කී අංක 2536 පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත, එකී පිඹුරට අනුව උතුරට : ගොරොක්ගහලන්ද වත්ත ද ; නැගෙනහිරට : ගොරොක්ගහලන්ද වත්ත ; දකුණට : ගොරොක්ගහලන්ද වත්ත ද සහ බටහිරට : ගොරොක්ගහලන්ද වත්ත ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර පහක් (අක්. 5, රූඩ් 0, පර්. 0) හෝ හෙක්ටයාර් 2.024ක් වන සම්පූර්ණ ඉඩම එහි පිහිටි සෑම සියලු දේ සමගය .

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

03-843/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.